www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජනාධිපති සිරිසේන අගමැති නෙරපා දමයි

Sri Lankan President Sirisena sacks prime minister

කේ. රත්නායක විසිනි

2018 ඔක්තෝබර් 28

දේශපාලන කුමන්ත්‍රනයකින් සිකුරාදා සවස අගමැති රනිල් වික්‍රමසිංහ ධුරයෙන් නෙරපා දැමූ ශ්‍රී ලංකාවේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ එම ධුරයට පත්කලේ ය.

එමගින්, 2015 පටන් රට පාලනය කල සිරිසේනගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ (ශ්‍රීලනිප) කන්ඩායම හා වික්‍රමසිංහගේ එක්සත් ජාතික පක්ෂය (එජාප) ගෙනගිය "ජාතික සමගි ආන්ඩුව" අවසන් කර දැමීමට සිරිසේන ක්‍රියාකලේ ය.

ඔහු මෙම පියවර ගත්තේ, 2015 අප්‍රේල් මාසයේ බලාත්මක කරන ලද ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය, තනි මතයට අගමැතිවරයෙක් නෙරපා හැරීම ඇතුලු විධායක ජනාධිපතිගේ බලතලවලින් සැලකිය යුතු කොටසක් කප්පාදු කර තිබුනු තත්වයකයි.

සිරිසේන හා රාජපක්ෂ, ඔවුන්ගේ ව්‍යවස්ථා-විරෝධී ක්‍රියාව අන්තිම මිනිත්තුව දක්වා ම තමන්ගේ සමීපතම සහචරයන් හැරුනු විට අන්සියල්ලන්ගෙන් අතිශය රහසිගත ව තබාගත්තෝ ය. මෙම කුමන්ත්‍රනය, ප්‍රගාඪ ආර්ථික අර්බුදයක්, නැගෙන භූ-දේශපාලනික ආතතීන් සහ කම්කරුවන් හා දුගීන්ගේ පන්ති අරගලයේ පුනර්ජීවනයක් මධ්‍යයේ ශ්‍රී ලංකාවේ පාලක පන්තිය මුහුන දෙන යෝධ දේශපාලන අර්බුදය පිලිබඳ ප්‍රකාශනයකි.

නව තන්ත්‍රය එහි ග්‍රහනය තද කරගැනීමේ පියවර ගනිමින් සිටී. රජයට අයිති රූපවාහිනී නාලිකාවලින් වික්‍රමසිංහට හිතවාදී කාර්ය මන්ඩලය රාජපක්ෂට හිතැති මැරයන් විසින් එලවා දැමී ය. මෙම නාලිකාවන්ගේ හා රජයට අයිති පුවත්පත් සමාගම වන ලේක් හවුස්හි පාලනය සිරිසේන ක්ෂනික ව සියතට ගත්තේ ය.

සිරිසේනගේ ක්‍රියාව "ව්‍යවස්ථානුකූල නැතැයි" නම්කල වික්‍රමසිංහ, තමන් තවදුරටත් අගමැති බව ප්‍රකාශ කරමින් " ඔහුගේ බහුතරය පෙන්වීම" සඳහා පාර්ලිමේන්තුව කැඳවන ලෙස ඉල්ලා සිටියේ ය.

සිරිසේන රට ප්‍රතිචාර දැක්වුයේ වික්‍රමසිංහ ඉවත් කිරීමට ගත් තීරනය වලංගු කිරීමටත් නොවැම්බර් 16 දා දක්වා පාර්ලිමේන්තු වාරය කල්දැමීමටත් ගැසට් පත්‍ර දෙකක් නිකුත් කරමිනි. රාජපක්ෂගේ නව කැබිනට්ටුව හෙට දිවුරුම් දෙනු ලැබීමට ඔහු සැලසුම් කරයි.

ආසන 225 කින් සමන්විත පාර්ලිමේන්තුවේ එජාපය නායකත්වය දෙන සන්ධානයට ආසන 106 කුත් සිරිසේන හා රාජපක්ෂට ආසන 95 කුත් තිබේ. ආසන 16 ක් හිමි දෙමල ජාතික සන්ධානයේ (ටීඑන්ඒ) සහයෝගය ගැන වික්‍රමසිංහ ගනන් බලයි. කිසිදු පාර්ශවයකට සහයෝගය නො දෙන බව ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) නිවේදනය කර තිබේ.

ශ්‍රීලනිපයේ හා එහි සහායකයන්ගේ මන්ත්‍රීවරුන්ගේ ඒකාබද්ධ කන්ඩායමක් අමතමින් සිරිසේන රැයේ ප්‍රකාශ කලේ ආන්ඩුව මූල්‍ය දූෂනවල ගිලී ඇති නිසා තමන්ට වික්‍රමසිංහ සමග තවදුරටත් වැඩකල නො හැකි බව යි. "තමන් ව ඝාතනය කිරීමේ කුමන්ත්‍රනයක්" පිලිබඳ තහවුරු නො කල කියාපෑමක් ද ඔහු විසින් ගෙනහැර දක්වා ඇත.

හිටපු සොල්දාදුවෙක් හා පොලිස් ඔත්තුකරුවෙක් වන නාමල් කුමාර නැමැත්තෙකු සැප්තැම්බරයේ කියා සිටියේ, නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා විසින් සිරිසේන හා හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ඝාතනය කිරීමේ කුමන්ත්‍රනයක් ගැන තමන් දන්නා බව යි.

සිරිසේනගේ චෝදනාවන් වනාහි ඔහුගේ ප්‍රජාතන්ත්‍ර-විරෝධී ක්‍රියාවන් සාධාරනීකරනය කිරීමට යොදාගන්නා ව්‍යාජ හේතූන් මිස වෙන කිසිවක් නො වේ. සිරිසේන, රාජපක්ෂ හෝ වික්‍රමසිංහ විසින් නායකත්වය දෙන ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්ථාපිතයේ කිසිදු කන්ඩායමකට මූලික ප්‍රජාතාන්ත්‍රවාදී අයිතීන් හා ව්‍යවස්ථාමය සම්මතයන් ගැන ඇත්තේ අවඥාවක් පමනි.

ජාතික සමගි ආන්ඩුව ස්ථාපනය කරන ලද්දේ රාජපක්ෂ බලයෙන් පහකල 2015 ජනාධිපතිවරනයෙන් පසුව ය. වොෂින්ටනය හා නව දිල්ලිය සමග එක්ව වික්‍රමසිංහ හා හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග විසින් ක්‍රියාවට දැමූ කුමන්ත්‍රනයක දී රාජපක්ෂ ආන්ඩුවේ ජ්‍යෙෂ්ඨ ඇමතියෙකු වූ සිරිසේන 2014 නොවැම්බරයේ ආන්ඩුවෙන් ඉවත් විය.

රාජපක්ෂ ආන්ඩුව ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් හා ජීවන කොන්දේසි මත එල්ල කල ප්‍රහාර මෙන් ම බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි යුද්ධයේ දී මිලිටරිය විසින් සිදුකල අපරාධයන් සම්බන්ධයෙන් කම්කරුවන් හා දුගීන් අතර පැවති පුලුල් විරෝධය සිරිසේන විසින් ගසාකෑවේ ය.

එක්සත් ජනපදය සැලකිලිමත් වූයේ රාජපක්ෂ ආන්ඩුවේ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් හා යුද අපරාධ පිලිබඳව නො වේ. එය, රාජපක්ෂ පාලනය චීනය සමග ගොඩනග ාගෙන තිබූ සමීප සබඳතාවන්ට හතුරු විය. වොෂින්ටනය වෙත තම විදෙස් පිලිවෙත ක්ෂනික ව මාරු කල සිරිසේන-වික්‍රමසිංහ ආන්ඩුව එක්සත් ජනපදයේ හා ඉන්දියාවේ මිලිටරි සමග සබඳතා ගැඹුරු කරගත්තේ ය.

එහෙත් මේ වනවිට ගැඹුරු වන මූල්‍ය අර්බුදයකට මුහුන දී ආන්ඩුවට සහයෝගය හා ආධාර පතා චීනය වෙතට හැරීමට බලකෙරී ඇත්තේ වොෂින්ටනය වෙතින් විශාල විවේචනයක් අවුලුවමිනි. ඒ අතර ම, සමාජ වියදම් හා මිල සහනාධාර

කප්පාදු කිරීම් ඇතුලු කප්පාදු විධානයන් ක්‍රියාත්මක කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඇප නයක් ගැනීමට ද ආන්ඩුවට බලකෙරී තිබේ.

මෙම ප්‍රහාරයන් කම්කරුවන්, ශිෂ්‍යයන් හා තරුනයන් අතරින් විරුද්ධත්වයක් අවුලුවා ඇත. මෑත මාස කිහිපය තුල දුම්රිය, රාජ්‍ය ප්‍රවාහන, සෞඛ්‍ය හා ජල සම්පාදන කම්කරුවන් මෙන් ම විශ්ව විද්‍යාල අනධ්‍යයන කම්කරුවන්, ගුරුවරුන් හා විශ්‍රාමිකයන් වැඩ වර්ජන හා විරෝධතාවල නිරත වූ හ. ව්‍යාජ-වාම සංවිධානවල පිටුබලය ලබන වෘත්තීය සමිති විසින් මෙම අරගල තාවකාලික ව යටපත් කරනු ලැබ ඇත.

ගෙවීගිය සති කිහිපය පුරා වතු කම්කරුවන් දසදහස් ගනනක් සියයට 100ක වැටුප් වැඩිවීමක් ඉල්ලමින් විරෝධතා ආරම්භ කර තිබේ. පසුගිය බදාදා වාර්ගික රේඛා කපාගෙන එක්සත් වූ 5,000ක් පමන තරුන කම්කරුවෝ වතු කම්කරුවන්ට සහයෝගය පලකිරීමට කොලඹ දී ප්‍රධාන රැලියක් පැවැත්වූ හ.

දිගට ම පවත්වාගෙන යන මිලිටරි වාඩිලාග ැනීමට හා බාදනය වන ජීවන කොන්දේසිවලට විරුද්ධ ව උතුරේ දෙමල වැඩකරන ජනයා අතර අතෘප්තිය ගැඹුරු වෙමින් තිබේ.

පසුගිය පෙබරවාරි මාසයේ පැවති පලාත් පාලන මැතිවරනයේ දී ආන්ඩුව කෙරෙහි ඇති විරෝධයේ තරම පෙන්වනු ලැබී ය. රාජපක්ෂ විසින් නායකත්වය දෙන ශ්‍රීලනිප කන්ඩායම ශ්‍රී ලංකා පොදුජන පෙරමුන (ශ්‍රීලපොපෙ) ලෙස මැතිවරනයට තරඟ කර බහුතර පලාත් පාලන ආයතන ගනනක පාලනය දිනාගත්තේ ය. සිරිසේනගේ කන්ඩායම එජාපයට පිටුපසින් තුන්වැනි තැනට පත්වූයේ "සමගි" ආන්ඩුවේ අර්බුදය තීව්‍ර කරමිනි.

රටෙහි ආර්ථික අර්බුදය පිලිබඳ ව එජාපයේ දූෂනයට චෝදනා එල්ල කරමින් ආන්ඩුවේ කප්පාදු පියවරවලින් දුරස්ථ වීමට සිරිසේන නරුම ලෙස උත්සාහ දරා තිබේ.

සිංහල-බෞද්ධ ස්වෝත්තමවාදී කන්ඩායම් හා මිලිටරිය සැනසීමට ද සිරිසේන උත්සාහ දරා ඇත. යුද අපරාධ සම්බන්ධයෙන් මිලිටරි නිලධාරීන් "දඩයම්" කිරීමට විරුද්ධ වී ඇති ඔහු, එවැනි නඩු සම්බන්ධයෙන් උසාවිවලට තොරතුරු නො දෙන ලෙස පොලීසියට නියෝග කර තිබේ.

කොලඹ වරායේ නැගෙනහිර පර්යන්තය ඉන්දියාව සමග බද්ධ ව්‍යාපාරයක් බවට පරිවර්තනය කිරීමේ ආන්ඩුවේ සැලසුම්වලට ජනාධිපතිවරයා මෑතක දී විරුද්ධ විය. මෙය සිංහල ස්වෝත්තමවාදී කන්ඩායම් විසින් දිරිමත් කරන ඉන්දියානු-විරෝධී භීතිකාව සමග එකපෙලට පිහිටයි.

වැඩෙන වැඩ වර්ජන හා විරෝධතා රැල්ල පිලිබඳ ව ශ්‍රී ලංකාවේ පාලක ප්‍රභූව වඩ වඩා තැතිගෙන සිටී. රාජපක්ෂ ව ස්ථාපනය කිරීමට දූෂනය පිලිබඳ උත්සුකයන් සමග මෙලෝ සම්බන්ධයක් නැති අතර, එහි ඉලක්කය වන්නේ කම්කරු පන්තිය බෙදා මර්දනය කිරීම යි.

දෙමල වැසියන්ට එරෙහි යුද්ධය අනුකම්පා විරහිත ව කරගෙන යාම හා ඕනෑම විරුද්ධත්වයක් මැඩීමට පොලිස් රාජ්‍ය විධික්‍රම යොදාගැනීම සම්බන්ධයෙන් රාජපක්ෂ කුප්‍රකට ය. "ගැඹුරු වන ආර්ථික තත්ත්වය නිසා කිව නො හැකි දුෂ්කරතාවන්ට මුහුන දී සිටින ශ්‍රී ලංකාවේ මහජනයාට උදවු කිරීමේ නව අභියෝගය" තමන් භාරගෙන ඇති බවත්, "එක්සත් ජනපද ඩොලරයට එරෙහි ව රුපියල අවප්‍රමානය වෙමින් ජීවන වියදම පිම්මලින් ඉහල යන" බවත් දිවුරුම් දීමෙන් පසු රාජපක්ෂ *සන්ඩේ ටයිම්ස්* පුවත්පතට කීවේ ය.

මෙය ඕවෙලියානු දෙබිඩි කතාවකි. පසුගිය මාසයේ *ද හින්දු* පුවත්පතට කතාකරමින් රාජපක්ෂ ප්‍රකාශ කලේ "ස්ථාවර ආන්ඩුවක්" නොමැති වීම නිසා ආයෝජකයන් ආපසු හැරී යන බව යි. "ආන්ඩුවක් ශක්තිමත් ව එක හඬින් සිටිය යුතු" යයි ඔහු කීවේ ය.

ඔහුගේ පුත් නාමල් රාජපක්ෂ රැයේ *නිව් යෝක් ටයිම්ස්* වෙත කතාකරමින් නග්න ලෙස මෙසේ ප්‍රකාශ කලේ ය: "දැන් නව ආන්ඩුව සමගින් ස්ථාවරත්වය උදාවනු ඇත. මහජනයා අපට විරුද්ධ විය හැකි වුවත් අවසානයේ අපි ආර්ථික හා සමාජ අස්ථාවරත්වයට විසඳුමක් ලඟා කරගන්නවා."

සිරිසේනගේ කුමන්ත්‍රනය භූ-දේශපාලනික ප්‍රතිමල්ලවතාවන් සමගින් කොලඹ දේශපාලන කුටෝපක්‍රම උත්සන්න කරනු ඇත. ශ්‍රී ලංකාවේ සිද්ධීන් දෙස සමීප ව බලා සිටින බවත් සියලු දෙනා "ව්‍යවස්ථාවට අනුකූල ව ක්‍රියා කරමින් ප්‍රචන්ඩත්වයෙන් වැලකී නිසි ක්‍රියාදාමය අනුගමනය කල යුතු" බව එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව ප්‍රකාශ කලේ ය.

ශ්‍රී ලංකාවේ අලුත් ආන්ඩුවක් චීනය දෙසට වාරු වීම එක්සත් ජනපදය විසින් නොඉවසනු ඇත. මේ මස මුල දී චීනයේ "රාජ්‍යතාන්ත්‍රික නය උගුල" හෙලා දුටු උප ජනාධිපති මයික් පෙන්ස්, ඒ සඳහා උදාහරනයක් ලෙස ශ්‍රී ලංකාව ගෙනහැර දැක්වී ය. හම්බන්තොට වරාය බීජිනය වෙත කල්බදු දීම මගින්, ශ්‍රී ලංකාව "චීනයේ වැඩෙන සාගර නාවික හමුදාවේ ඉදිරිපෙල මිලිටරි කඳවුරක් බවට ඉක්මනින් ම පත්වනු" ඇතැයි ඔහු කියාසිටියේ ය.

ඉන්දියානු ආන්ඩුව කිසිදු ප්‍රකාශයක් කර නැතත්, මාධ්‍යයන් අනතුරු අඟවන්නේ ඉන්දියාවේ ප්‍රතිමල්ලව චීනය වාසි ලබනු ඇති බව යි. *ටයිම්ස් ඔෆ් ඉන්දියා* තීරු ලිපි රචක ඉන්ද්‍රානි බාග්චි මෙසේ ලියුවාය: "ඉන්දියාවට ශ්‍රී ලංකාව තුල බලගතු ආරක්ෂක අවශ්‍යතා තිබෙන අතර, විශේෂයෙන් ම මාලදිවයින හා එහි ධුරය හැර යන ජනාධිපතිවරයා විසින් මතු කරන දුෂ්කරතාවන්ගේ තතු යටතේ ශ්‍රී ලංකාව තුල චීනය පෙනී සිටීම මෝදි ආන්ඩුවට අප්‍රිය වනු ඇත."

රාජ්‍යතාන්ත්‍රික පෙලගැසීම රැයේ එලිමහනට පැමිනියේ ය. එක්සත් ජනපදයේ, එක්සත් රාජධානියේ, යුරෝපා සංගමයේ, ජපානයේ හා ඉන්දියාවේ විදෙස් රාජ්‍යතාන්ත්‍රිකයන් වික්‍රමසිංහ මුනගැසුනු අතර කොලඹ චීන තානාපති චෙං ක්ෂුවෙයාං, ජනාධිපති ෂී ජිංපිංගේ උනුසුම් සුභපැතුම් පිරිනැම්ම සඳහා රාජපක්ෂ ව මුනගැසුනි.

කම්කරුවන්ගේ හා ග්‍රාමීය ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී හා සමාජ අයිතීන් මත ප්‍රහාර එල්ල කිරීමේ දිගු ඉතිහාසයකට හිමිකම් කියන පාලක ප්‍රභූවේ කිසිදු පාර්ශවයක් ගැන කම්කරු පන්තියට කිසිදු මිථ්‍යාවක් තිබිය නො හැක. ඊලඟ ආන්ඩුව කවුරුන් විසින් තැනුවත්, එම ආන්ඩුව ආර්ථික අර්බුදයේ බර කම්කරුවන් මත පැටවීමටත් විරුද්ධත්වය මැඩීමට පොලිස් රාජ්‍ය පියවර භාවිතා කිරීමටත් ක්‍රියා කරනු ඇත.

© www.wsws.org